# Putting Jesus at the centre of Christmas (23 Dec 18)

## නත්තලේ ප්‍රධාන තැන යේසුස්වහන්සේට දීම

**1 මේ නත්තලේ යේසුස්වහන්සේට ඉඩ සලසා දෙන්න.**

***ලූක් 2:7*** *"ඈ කුලුදුල් පුත්‍රයා වදා, රෙදිවලින් ඔතා, ඔවුන්ට නවාතැන් ගෙයි ඉඩ නොතිබුණු බැවින් ගවයන් කන ඔරුවක තැබුවාය."*

සමාදානයේ කුමාරයා, දෙවින්වහන්සේගේ පුත්‍රයා ඉපදුන විට කිසිම තැනක ඉඩක් සොයාගත නොහැකි විය, එපමණක් නොව, උන්වහන්සේට ඉඩක් සලසා දීමට කිසිම කෙනෙක් කැමති වුනේ නැත. අප ඉක්මණින්ම නත්තල  සමරන්නට යන අතර, මේ උත්සවය ගැන අපගෙන් වැඩි දෙනෙක් දැඩි උනන්දුවක් දක්වන්නෙමු, අප එසේ විය යුතුය. ඒ දවස උදා වන තුරු අප බලා සිටින්නෙමු. මේ එක දවස වෙනුවෙන් වෙන සූදානම් වීම කොපමණද? මිනිස්සු කලබලයෙන් බඩු ගනිති, තෑගි ඔතති, නත්තල් තෑගි දමන දිග මේස් වැනි දේ පුරවති, කෑම සහ බීම වර්ග රැස්කරති. ඔවුන්ගේ ගෙවල් සරසති. අවුරුද්දකට වරක් එන මෙම උත්සවයට බොහෝ දේවල් සිදුවේ. කිතුණුවන් මෙන්ම කිතුණු නොවන අයද මේ සුවිශේෂී උපත සමරති. ඒ ඉතාමත්ම සුවිශේෂී පුද්ගලයා නිසාය!

**යේසුස්වහන්සේ මෙතරම් සුවිශේෂී වුනේ ඇයි?**

***<u>යොහන් 1:1-2</u>*** *කිසිම දෙයක් පවතින්නට පෙර ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ සමග සිටිසේක. උන්වහන්සේ නිතරම දෙවියන්වහන්සේ සමග ජීවමානව සිටි අතර උන්වහන්සේම දෙවියන්වහන්සේව සිටින සේක. 3 පවතින සෑමදෙයක්ම උන්වහන්සේ මැවූසේක- උන්වහන්සේ විසින් නොසාදන ලද කිසිවක් නැත්තේය. 4 උන්වහන්සේ තුළ සදාකාල ජීවනය තිබේ, මේ ජීවනය සියලු මනුෂ්‍ය වර්ගයාට ආලෝකය දෙන්නේය. 5 අන්ධකාරය තුළ බබලන ආලෝකය නම් උන්වහන්සේගේ ජීවනයයි- <u>අන්ධකාරයට කිසිවිටක එය නිවා දැමිය නොහැක.</u>*

කිසිවක් පැවතෙන්නට පෙර ක්‍රිස්තුස්වහන්සේ සිටිසේක. උන්වහන්සේ දෙවියන්වහන්සේ මෙන්ම මනුෂ්‍යයෙක්ද වූසේක. යේසුස්වහන්සේ රාජකීයත්වය සහ රාජකීය සියලුම දේවල් සහ දේවත්වයේ තිබෙන සියලුම වරප්‍රසාද අත් හැර, වහලෙකුගේ තත්වයට පැමිණ, මන්ෂ්‍යයෙක් වූසේක! (පිලිප්පි 2:6-7)

**උන්වහන්සේ සෑමදෙයක්ම මැවූසේක-** උත්පත්ති 1:1 පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූසේක. *උත්. 1:26 "* පොළොවේද  ගුවන්තලයේ සහ මුහුදේද සිටින සියලුම ජීවමාන සත්වයන් කෙරෙහි ආණ්ඩු කරන පිණිස අපගේම ස්වරූපයෙන් මනුෂ්‍යයා සාදමු."* කාලයාගේ පටන්ගැන්මෙහිදී අපි යේසුස්වහන්සේ- ත්‍රිත්වය, දකින්නෙමු.

**යේසුස්වහන්සේ තුළ සදාකාල ජීවනය තිබේ- යොහන් 3:16** යේසුස්වහන්සේ කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ලැබෙන බව පවසයි.

මේ නත්තලේදී අපේ සිත් තුළ  අපි යේසුස්වහන්සේට ඉඩකඩ සලසා දෙයිද නැත්නම් ඉතිරිව තිබෙන ඉඩක් උන්වහන්සේට දෙනවා ඇද්ද? කියා මම පුදුම වෙමි. උන්වහන්සේට අවශ්‍ය දේවල් වලින් අපගේ ජීවිත පුරවන්නට අප ඉඩකඩ සලසා දෙනවාද? නැත්නම් අපගේ ජීවිත ගමනේදී අප එක්තුකරගත් දේවල් වලින් අපගේ ජීවිත පිරී තිබෙනවාද?

**2. උන්වහන්සේගේ වචනයට ඉඩ සලසා දෙන්න.** ***1 තිමෝති 3:16*** *" දෙවියන්- වහන්සේ ගේ සේවකයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ප්‍රයෝජනවත්ව තිබේ."*

මේ ප්‍රශ්නය සමග අපට අභියෝගයක් කරන්නට මට අවශ්‍යයි, අපි අපගේ ජීවිතවල දෙවියන්වහන්සේගේ වචනයට ඉඩකඩ සලසා දෙනවාද?

උන්වහන්සේගේ වචනය විකල්ප පොතකට වඩා වැඩි බව, දෙවියන්වහන්- සේගේ හුස්ම/දේවානුභාවය ඇති, සෘජුවම අපට, අපගේ ජීවිතවලට දුන් උන්වහන්සේගේ වචනයි! අපට උන්වහන්සේ සමග සම්බන්ධතාවයක් තිබෙන්නේ සියලුම යහපත් ක්‍රියාවන් කරන පිණිස අපව සූදානම් කරන්නට අපට කථා කරන, උන්වහන්සේගේ වචන තුළින්ය!

උන්වහන්සේගේ වචනය දිනපතා පිලිවෙලකට කියවමින්, අපි උන්වහන්සේගේ වචනයට ඉඩ සලසන විට, බොහෝවිට අපි නොදැනුවත්වම ඇතුලාන්තයෙන්ම එය අපව වර්ධනය කරයි.

ඉදිරි ජීවිතයට ඔබව සූදානම් කරන පිණිස දිනපතා ක්‍රමවත්ව දේවවචනය කියවා එයට ඉඩ නොහරින්නේ ඇයි? පොත්, ටී වී වැඩ සටහන්, යහළුවන් වැනි වෙනත් බොහෝ දේවල් වලට අපි කාලය සපයා දෙන්නෙමු. ඒත් අපව වර්ධනය කරන්නේ සහ සන්නද්ධ කරන්නේ එක පොතකි- ඒ දේව වචනයයි!

**3 උන්වහන්සේගේ සැපයීමට ඉඩ සලසා දෙන්න-** ***<u>පිලිප්පි 4:19</u>***  ක්‍රිස්තුස්-වහන්සේ අප උදෙසා කළ දේවල් නිසා උන්වහන්සේගේ තේජසේ සම්පතේප්‍රකාරයට නුඹලාගේ සියලුම හිඟකම් සපයන්නේ  උන්වහන්සේය.

<u>2 කොරින්ති 9:11</u> ඔව්, ඔබට බොහෝ ලෙස අන් අයට දෙන්නට හැකිවන පිණිස දෙවියන්වහන්සේ ඔබට බොහෝ වැඩියෙන් දෙනු ඇත. ඔබ දෙන තෑගි අපි අවශ්‍යතා තිබෙන අයට ගෙන ගොස් දුන් විට ඔවුන් ඔබගේ උපකාර ගැන දෙවියන්වහන්සේට ස්තුති කරමින් ප්‍රශංසා කරනවා ඇත. අප ආශීර්වාද ලබා ඇත්තේ අනෙක් අයට ආශීර්වාදයක් වෙනපිණිසය.

හිතෝපදේශ 11:24-26 "පරිත්‍යාගශීලී අයගේ ලෝකය වැඩි වැඩියෙන් විශාල වෙනු ඇත. ලෝභයන්ගේ ලෝකය වැඩි වැඩියෙන් කුඩා වෙනු ඇත. අනෙක් අයට ආශීර්වාද කරන්නා බොහෝ ආශීර්වාද ලබන්නේය. අනෙක් අයට උපකාර කරන්නා උපකාර ලබන්නේය.

මේ පදය ඒ උඩ යටිකුරු වු පදවලින් එකකි! එහි කිසි අදහසක් ඇති බවක් නොපෙනේ. ඔබ වැඩියෙන් දෙන විට, ඔබට තිබෙන දේවල් අඩුවන බව කුඩා ළමයින්ට වුනත් වැටහෙන ස්වාභාවික මූලධර්මයකි! දෙවියන්වහන්සේගේ ආර්ථිකය මත එය එසේ නොවෙයි!

දෙවියන්වහන්සේ විසින් බහුලව සැපයීම සෑම කෙනෙකුටම අවශ්‍යය ! සෑමදෙනාටම අවශ්‍ය ගොඩගසාගෙන ඉතිරි කරන්නටය. ප්‍රඥාව කියන්නේ එසේ කරන්න කියාය. නමුත් බයිබලය කියන්නේ, විශාල ලෙස ආශීර්වාදලත් ජීවිතයක් ගත කිරීමට මාර්ගය නම් දීමෙන් සහ පරිත්‍යාගශීලී වීමෙන් කියාය.

සත්‍යය නම් දෙවියන්වහන්සේට අවශ්‍ය අපි පිරුණාවූ ජීවිත ගතකිරීම නොව විශාලවූ ජීවිත ගතකිරීමයි. අප විසින් මිනිසුන්ට ප්‍රේමකරන්නට තරම් ඉඩ ප්‍රස්තාවක් තිබෙන විශාල ජීවිත ගතකිරීම, දෙවියන්වහන්සේට අවශ්‍යයි. උන්වහන්සේට අප විසින් යම් කෙනෙකුට උදව් කරන්නට අවශ්‍ය වූවිට උන්වහන්සේගේ කටහඬ අසන්නට පුලුවන් තරමට විශාල ඉඩක් ඇති ජීවිත. අප අවට සිටින්නන්ට උන්වහන්සේගේ අත් සහ කකුල් වීමට කීකරු වෙන්නට තරම් විශාල ඉඩක් ඇති ජීවිත.

නමුත් බොහෝ විට අපගේ ජීවිත තව වැඩිපුර ලබා ගැනීමට ඇති ආශාවන්ගෙන් පිරී තිබිය හැක. සැසඳීම්වලින්, අනාරක්ෂිතභාවයෙන් පිරුණු ජීවිත ගතකරනවා විය හැක. එවිට අපගේ ජීවිත තුළින් දෙවියන්වහන්සේට ක්‍රියා කිරීමට ඉඩක් නැති වේ!

අපගේ වචන, අපගේ කාලය, අපගේ සමාවදීම, අපගේ කරුණාව වැනි දේවල් වලින් අපි අනෙක් අයට සපයන විට සහ පරිත්‍යාගශී වීමට අපි තෝරා ගන්නා විට, අපට අවශ්‍ය සියල්ලම සැපයීමට අපි දෙවියන්වහන්සේට ඉඩ සලසා දෙන්නෙමු.

මේ නත්තල් කාලයේ දීමෙන් සහ පරිත්‍යාගශීලී වීමෙන් සහ යම් කෙනෙකුට ආශීර්වාද කරන පිණිස වැඩිපුර සැතපුමක් යාමෙන්, විශාල ජීවිත ගත කිරීම ගැන අවධානය යොමු කරමු. මේ නත්තල් කාලයේ අපේ මමත්වයෙන් සහ ආත්මාර්ථකාමී ආකල්පවලින්ද තමන් ගැනම මුල්තැන දෙන ජීවිත රටාවෙන්ද පිරී තිබෙන අනවශ්‍ය දේවල් ඉවත් කරමින් දෙවියන්වහන්සේට පුරවන්නට හැකිවන පිණිස අපේ ජීවිතවල ඉඩකඩ සලසා දෙමු.

උන්වහන්සේගේ වචනයට අප තුළ පවතින්නට ඉඩ දීමෙන් සහ අනෙක් අයට ආශීර්වාදයක් වීමෙන් සමාදානයේ කුමාරයා වන යේසුස්වහන්සේට අපගේ ජීවිත තුළ ඉඩකඩ සලසා දෙමු.

යේසුස්වහන්සේ මාර්ගයද සත්‍යයද වන බැවින් උන්වහන්සේ කරණාකොට- ගෙන අපට නිදහස්වෙන්නට උන්වහන්සේ මාර්ගයක් දුන්සේක.

අද ඔබට පූර්ණ ජීවිතයක් ලබා ගත හැකියි, අද ඔබට යේසුස්වහන්සේට ඉඩ දිය හැකියි, අද සියල්ලම යහපත සඳහා වෙනස් විය හැකියි, ඔබේ ජීවිතය සම්පූර්ණයෙන්ම සකස්කරන්නට යේසුස්වහන්සේට ඉඩ දීමෙන් අද ඔබට බලාපොරොත්තුවක් ඇති කර ගත හැකියි. අද ඔබගේ දවස විය හැකියි!

මම සරල යාච්ඤාවක් කරන්නට යනවා, ඔබට පූර්ණ ජීවිතයක් අත්දකින්නට අවශ්‍ය නම් මා සමග ඔබට මේ යාච්ඤාව කළ හැකියි. යේසුස්වහන්ස ඔබ මා වෙනුවෙන් පැමිණ මා නිදහස් කරන පිණිස මැරුණු බව මා පිලිගන්නෙමි. මට ඔබවහන්සේගේ නිදහස අවශ්‍යයි. එමනිසා මම දැන් මාගේ ස්වාමින්වහන්සේ සහ ගැලවුම් කරුවා ලෙස පිලි ගනිමි. ආමෙන්!